ලිංගික අපරාධයක් යනු නීතිය ඉදිරියේ වරදක් මෙන්ම, සමාජ ගැටළුවක් ලෙසින් ද හඳුනාගත හැක. ඒ අනුව, ලිංගික අපරාධයක්, විශේෂයෙන්ම ළමා ලිංගික අපයෝජනයක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී පවා, එහි සැබෑ බරපතල භාවය පාඨකයාට පැහැදිලිව සන්නිවේදනය කළ යුතු නොවේදැයි, පාඨක අප ඇසිය යුතුයි.

නිදසුනක් ලෙසින්, අරුණ පුවත්පතේ (ජන. 12, 2023) පළ වූ පුවත ගත හැක. ළමා ලිංගික අපයෝජනයන් සම්බන්ධ චෝදනා මත, චීවරධාරියෙකු අත්අඩංගුවට ගත් බව මෙහි සඳහන්ව තිබිණි.

"ළමා නිවාසයේ දරුවන්ට නරක වැඩ කළැයි සුධම්ම සාදු අත්අඩංගුවට" යන සිරස්තලය යටතේ මෙම පුවත දැක්වී තිබුණි.

කෙසේ නමුත්, පුවත් අන්තර්ගතය තුළ සඳහන්ව තිබුණේ මෙය ළමා ලිංගික අතවරයක් බවයි.

1) ළමා ලිංගික අපයෝජන වරදක්, "නරක වැඩක්" ලෙසින් දැක්වීම ඔස්සේ, මෙම සිරස්තලය තුළ එම වරද සැහැල්ලු කොට දැක්වී ඇතැයි (trivialisation) ඔබ නොසිතන්නේ ද?

2) එය මෙවැනි වරදක සැබෑ බරපතල භාවය සමාජයට පැහැදිලිව සන්නිවේදනය නොවීමටත්, එවැනි වැරදි සාමාන්‍යකරණය වීමටත් හේතුවක් නොවනු ඇති ද?

ලිංගික අපයෝජනයන් සැහැල්ලු කොට නොදක්වමු!